# අනුරාධපුරය ආශ්‍රිත ස්වභාවික හා රූ දෙස් සංචරණ විභවතාවන් හඳුනාගැනීම හා සංචරණ ගමනාන්ත කළමණාකරණ සැලැස්මක් යෝජනා කිරීම.

ඩී.එස්.ඒ මුණසිංහ
කැලණිය විශ්ව විද්‍යාලය.
Anuzone92@gmail.com

අනුරාධපුරය ලෝක සංචාරක කර්මාන්තය තුළ සංචාරකයා විසින්, ශ්‍රී ලංකාව තුළ හඳුනා ගන්නා අද්විතීය සංස්කෘතික සංචරණ ගමනාන්තයක් ලෙස සටහන් කළ හැකිය. ඉහළ කීර්තියක් සහිත ලෝක උරුම ස්ථානයක් වන අනුරාධපුරය සංස්කෘතික හා ආගමික සංචාරකයන් පැමිණීමේ වඩා වැඩි නැඹුරුවටකට මුහුණ දී සිටින අතර එයට ලබාදීමට හැකියාව පවතින ගුණාත්මක සංචාරක අත්දැකීම් තවදුරටත් ලබා දීමේ විභවයක් පවතී. අනුරාධපුර පූජා නගරය හා එහි තදශ්‍රිතය ආශ්‍රිත ස්වභාවික පරිසරය හා වර්තමාන ජෛවවිවිධත්වය උපයෝගී කරගනිමින් ස්වභාවික හා රූ දෙස් සංචරණ ගමනාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කිරීමේ විභවතාවන් හඳුනා ගනිමින් සංචරණ කළමණාකරණ සැලැස්මක් යෝජනා කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙහිදී දත්ත එක්රැස් කිරීමට ප්‍රථමික හා ද්විතියික ක්‍රමවේදයන් භාවිතා කරන ලද අතර ක්ෂේත්‍ර අධ්‍යනයන් ප්‍රධාන වශයෙන් සිදුකරන ලදි. සාමානය තොරතුරුවල සිට ශාස්ත්‍රීය සහ විශේෂඥ දැනුම දක්වා වෙළඳපොල කාණ්ඩය සහ කාල ප්‍රමාණය පදනම් කරගත් පෞද්ගලික මගපෙන්වීම ඇතුලත් වැඩිදියුණු කළ පරිවර්තන පහසුකම් හා පරිසර හිතකාමී සහ ඓතිහාසික පසුතලයට ගැළපෙන ක්‍රමවේද තුළින් වර්තමාන අත්දැකීම සඳහා වටිනාකම් එක් කිරීමටත් ප්‍රජා සහභාගිත්වය තුළින් ස්ථානීය ග්‍රාමීය ආර්ථිකය නැංවීමටත් ඒ තුළින් පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයන් කෙරෙහි ඇතිවන පීඩනයන් අවම කරමින් එම උරුමයන් කළමණාකරණයට පවත්නා අවස්ථාවන් හා විභාවතාවයන් මෙහිදී හඳුනා ගන්නා ලදි. එහිදී ලද නිරීක්ෂණයන්ට අනුව දින 10 ක් දක්වා වන උපරිම සංචාරක අත්දැකීම් කාණ්ඩ සහිත සංචරණ කළමණාකරණ සැලැස්මක් නිර්මාණය කරන ලදි.

**ප්‍රමුඛ පද :** අනුරාධපුරය; ගමනාන්ත; විභවතාවයන් ; සංස්කෘතික උරුමයන්; ස්වාභාව සංචරණය.